# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011

### 2013 මැයි - අගෝස්තු

### මානවශාස්ත්‍ර පීඨය

### බෞද්ධ සංස්කෘතිය - **BUCU- E1015**

### භාරතීය සංස්කෘතික පසුබිම හා බෞද්ධ සංස්කෘතියේ මූලධර්ම

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. ප්‍රාග් වෛදික භාරතීය සමාජය පිළිබඳ හැඳින්වීමක් කොට, එකල පැවති ආගමික විශ්වාස ඓතිහාසික නයින් පැහැදිලි කරන්න.

02. පාරිසරික ක්‍රියාකාරකම් විෂයයෙහි දේවත්වය ආරෝපණය කිරීමෙන් දේව මණ්ඩලයක් බිහිවූ ආකාරය වෛදික සාහිත්‍යය ඇසුරෙන් පෙන්වා දෙන්න.

03. ආගමික වශයෙන් මෙන්ම සාමාජික වශයෙන් ද සිය ආධිපත්‍යය තහවුරුකර ගැනීමට බ්‍රාහ්මණ පිරිස් ක්‍රියාකොට ඇති ආකාරය මූලාශ්‍රය නයින් පැහැදිලි කරන්න.

04. 'කර්මමාර්ගය' යනු කුමක්දැයි පැහැදිලි කොට, ආරණ්‍යක අවධියෙහි භාරතීය ආගමික චින්තනය ඥානමාර්ගය දෙසට යොමුවන ආකාරය ආරණ්‍යක සාහිත්‍යය ඇසුරෙන් පරීක්ෂා කරන්න.

05. මක්ඛලීගොසාල හෝ පූරණකස්සප යන ආචාර්යවරුන් දෙදෙනාගෙන් එක් අයකුගේ ඉගැන්වීම් ගෙනහැර දක්වා, එය බෞද්ධ ඉගැන්වීම් මගින් විචාරයට ලක්වන ආකාරය පෙන්වා දෙන්න.

06. ඊශ්වර නිර්මාණවාදය පිළිබඳ ප්‍රමාණවත් හැඳින්වීමක් කොට, බුදුදහමෙහි පැනෙන අනීශ්වරවාදී පදනම විවරණය කරන්න.

07. සිතීමේ, විමසීමේ නිදහස හා සචේතනික ක්‍රියාව පිළිබඳ වගකීම බෞද්ධ ඉගැන්වීම් මගින් තහවුරු වී ඇති ආකාරය මූලාශ්‍රය නයින් පරීක්ෂා කරන්න.

08. සමාජ වර්ගීකරණය පිළිබඳ බ්‍රාහ්මණ මතය ගෙනහැර දක්වා, මානව වාර්ගයාගේ ඒකත්වය තහවුරු කිරීමට බුදුසමය ක්‍රියාකොට ඇති ආකාරය අදාළ සූත්‍ර දේශනා අසුරෙන් පැහැදිලි කරන්න.

09. "ආර්ය අෂ්ටාංගික මාර්ගය ගිහි-පැවිදි උභය පක්ෂයේම අභිමතාර්ථ සපුරාලන පිළිවෙතකි." සකාරණව තහවුරු කරන්න.

10. ස්ත්‍රීත්වය, ඇයගේ වගකීම හා කාර්යභාරය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මූලාශ්‍රය නයින් පරීක්ෂා කරන්න.

****************************************